තුන්වන පිටෙන්

හෙට දවසේ .....

නීතිපතිවරයා විසිනි. ඊට එකම හේතුව සියල්ලෝම දනිති. ඔහු එක්සත් ජාතික පක්ෂයෙන් ලත් මන්ත්‍රීධුරය සහිතවම ජනාධිපතිවරයාගේ දෑත් ශක්තිමත් කිරීම සඳහා ආණ්ඩුවට එකතු වීමට කළගුණ සලකන්නටය. දැන් චන්දික කත්‍රිආරච්චි මහතා චෝදනාවලින් නිදහස ලබන්නේද, ඔහු ජනාධිපතිතුමා කෙරෙහිත්, ආණ්ඩුව කෙරෙහිත් දක්වන දේශපාලන ලැදියාව නිසා බවට විවාදයක් නැත.

එහෙත්, ඉතා යහපත්, ජනතාවගේ සැබෑ නායකයා ලෙස විරදාවලි ලබා සිටින මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යටතේ පවතින නීතිපති දෙපාර්තමේන්තුවෙන් මෙවැනි අකටයුතුකම් සිදුවනවායැ'යි මාධ්‍යයකින් පැවසීම ජනාධිපතිතුමා සමග ආරෝචක් ඇති කර ගැනීමකි. එවැනි මහජන අයිතිවාසිකම්වලට අදාළ වන විෂයයක් ගැන කතා කිරීමට වඩා, ජනාධිපතිතුමා උද්‍යසන ව්‍යායාමවල යෙදෙන ආකාරය පසෙකට වී බලා සිට සිය පාඨකයන් වෙත වර්ණනා විෂයතික්‍රාන්තව ලිවීම වැනි දේ මේ කාලයේ පුවත්පත් කතුවරුන්ගේ යුග මෙහෙවර හා නිරාමිස සතුට පිණිස වන දේ බවට පත්ව තිබේ.

එහෙත් කනගාටුදායක ඇත්ත නම්, නීතිපති දෙපාර්තමේන්තුව මුළුමතින්ම ආණ්ඩුවේ අතකොළුවක් ලෙස ක්‍රියාකරන බවය. රටේ මහජන මුදල් වංචාකිරීම සම්බන්ධයෙන් මහජනතාවට ඉටු විය යුතුව තිබූ යුක්තිය අබ්දුල් කාදර් නඩුවේදී පැහැර හැරියාක් මෙන්ම, චන්දික කත්‍රිආරච්චි මහතාගේ සහ සගයන්ගේ ක්‍රියාකලාපය නිසා, ජීවිතය අහිමි වූ පුද්ගලයාගේ ඥාති හිතෙෂීන්ට හිමිවීමට තිබූ යුක්තිය හා සාධාරණත්වය නීතිපතිවරයා විසින් අහිමිකර තිබේ. දීර්ඝ නඩු විභාගයක් පැවැත්වීම හෝ අධිකරණය විසින් චෝදනාවල සාර්ථක අසාර්ථකභාවය තීරණය කිරීම නිසාම අනිවාර්යයෙන්ම සාධාරණ සහ යුක්තිය ඉටුවනවාය කියා නියමයක් නැති වූවත්, අඩුගණනේ ඒ ගැන විධිමත් විමර්ශනයක් කෙරෙන්නේය යන්න ගැන ඔවුන්ට තිබූ විශ්වාසයද අද නැතිවී ගොසිනි. මෙවැනි සිදුවීම්වලින් ලැබෙන ප්‍රතිඵලය නම්, හුදෙක් නීතිපතිවරයා ගැන පමණක් නොව මුළුමහත් අධිකරණ පද්ධතිය ගැනම ඇති ජනතා විශ්වාසය බිඳවැටීමයි. රටේ සාමාන්‍ය ජනයා නීතිපතිවරයාගේ කාර්යභාරයත්, අධිකරණයේ කාර්යභාරයත් අතර වෙනස නොහඳුනති. ඔවුහු සිතන්නෝ නීතිපතිවරයාද අධිකරණය මෙන්ම තමන්ට යුක්තිය ඉටු කිරීමේ කාර්යභාරයේ වැදගත් භූමිකාවක් ලෙසය. එහෙයින්, නීතිපතිවරයාගේ මෙවැනි දේශපාලන අපචාරයන් විසින් අවසානයේ කිලිටි කරන්නේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ යහපත් නාමයයි.

සාමාන්‍යයෙන් අපේ රටේ අධිකරණ සම්ප්‍රදායය අනුව නීතිපතිවරයා, අගවිනිසුරුවරයා ලෙස ඊළඟ පත්වීම ලබන්නේය. වත්මන් අගවිනිසුරු අශෝක ද සිල්වා මහතා මේ වසරේ මැද භාගයේදී විශ්‍රාම යෑමට නියමිතව තිබෙන අතර, ඉන්පසු අගවිනිසුරුධූරයට වත්මන් නීතිපති මොහාන් පීරිස් මහතා පත්කරනු ඇතැ'යි බලාපොරොත්තු වෙයි. ඒ පත්කිරීම සම්බන්ධව මුළු බලය ඇත්තේ ජනාධිපතිතුමාටය. මීට පෙර චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය, සරත් එන්. සිල්වා මහතා අගවිනිසුරුවරධූරයට පත් කරන අවස්ථාවේදී ද සරත් එන් සිල්වා මහතාට එරෙහිව නීතිපති වශයෙන් සිය බලය අනිසි ලෙස යොදා ගැනීම ගැන චෝදනා රාශියක් තිබුණේය. ඔහුට එරෙහිව නඩුද විභාග වෙමින් තිබුණේය. ඔහු අගවිනිසුරුධූරයට පත් කැරුණේ, එම චෝදනා, නඩු මෙන්ම ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් විශාල පිරිසක් ද එය නොකරන්නැ'යි ජනාධිපතිනියගෙන් ඉල්ලා සිටි මුත් ඒවා ගණනකට නොගෙනය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය සිතුවේ, එවැනි අඳුරු චරිතයක් ඇති පුද්ගලයකු අගවිනිසුරු, කිරීමෙන් තමාගේ අණසකට මුළුමතින් යටත් අධිකරණයක් පවත්වාගෙන යන්නටය. සියයට සියයක් එය මුදුන්පත් නොවූ නමුත්, ඒ කාලයේ සරත් එන් සිල්වාගේ ප්‍රධානත්වයෙන් යුත් අධිකරණ ක්‍රියාකලේ විධායකයේ අතකොළුවක් ලෙසම මිස ජනතාවට යුක්තිය ඉටු කරන ස්වාධීන ආයතනයක් ලෙස නොවන බව සියල්ලෝ දනිති. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ධුර කාලයේ මුල් කොටස තුළත් සරත් එන් සිල්වා මහතා අගවිනිසුරු ලෙස ඉටුකළේ අතකොළුවක කාර්යභාරයම මිස ස්වාධීන භූමිකාවක් නොවේ, මේ අවධි දෙකෙහිදීම ඔහු පොද්ගලිකව විනිශ්චයාසනයේ වාඩිවී තීරණ දුන් හා ඉදිරියට ගෙනයෑම වැළැක්වූ නඩු ගැන විධිමත් සමාලෝචනයක් කළහොත් එය මැනැවින් පැහැදිලි වනු ඇත.

දැන් සරත් එන් සිල්වා යුගය අවසන්ය. කවර ප්‍රතු වේදිකාවන්හි අසුන්ගෙන සිටියත් අධිකරණය කෙළෙසීම සම්බන්ධයෙන් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියටත්, සරත් එන් සිල්වා මහතාටත් හිමිවිය යුතු අපවාදයන්ගෙන් ගැලවීමට හැකියාවක් නැත.

දැන් මහින්ද රාජපක්ෂ, මොහාන් පීරිස් යුගයයි. මොහාන් පීරිස් මහතා ද දැන් නිරතවී සිටින්නේ සිය බලය පාවිච්චි කරමින්, දේශපාලනික වශයෙන් ආණ්ඩුවට අවශ්‍ය ලෙස නීතිපතිධූරය හසුරුවන, ජනතාවගේ අයිතිවාසිකම් හා ඔවුන්ට ඉටුවිය යුතු යුක්තිය ලැජ්ජා සහගත ලෙස දේශපාලන න්‍යාය පත්‍රයක් තුළ සඟවමින් සිටින භූමිකාවකය. නීතිපති දෙපාර්තමේන්තුව තුළ යුක්තිය, සාධාරණත්වය අගයන රජයේ නිතිඥවරුන් අතර නීතිපතිවරයා අවමානයට ලක්වෙමින් සිටින බවද, ඔවුන් අතර නීතිපති දෙපාර්තමේන්තුවේ වත්මන් කටයුතු ගැන විශාල කලකිරීමක් තිබෙන බවද අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධ රහසකි. අබ්දුල් කාදර්, චන්දික කත්‍රිආරච්චි වැනි ප්‍රසිද්ධ නඩුවලදී මෙන්ම තවත් අප්‍රසිද්ධ අවස්ථා කිහිපයකදීම නීතිපතිවරයා මේ ආණ්ඩුව කෙරෙහි සිය දේශපාලන ගැතිභාවය මැනැවින් ප්‍රකට කර තිබේ. ඔහු සරත් එන් සිල්වාගෙන් වෙනස් වන්නේ නම්න්, ක්‍රියාකලාපයේ විලාසිතාවෙන් හා ඔහුට එරෙහිව බලය අන්තනෝමතික ලෙස පාවිච්චි කළේය'යි කියන නඩු නොමැතිකමෙන් පමණකි. (චන්දික කත්‍රිආරච්චි නිදහස් කිරීම සම්බන්ධයෙන් අත්‍යන්තියට පත් පාර්ශ්වය ඉදිරියේදී ඔහුට එරෙහිව රිට් ආඥාවක් ඉල්ලා අධිකරණයට ගියහොත්, ඔහුට එරෙහිවද නඩුවක් ආරම්භ වන්නේය.)

නීතිපති දෙපාර්තමේන්තුව පවතින්නේද ජනාධිපතිවරයාගේ යටතේය. එහයින් සලකන කළ, අනාගතයේ අගවිනිසුරු ධුරයට පත්වන්නේ දැන් ජනාධිපතිවරයා යටතේ තිබෙන දෙපාර්තමේන්තුවක ප්‍රධානියෙකි. එහි අවසාන ප්‍රතිඵලය වනු ඇත්තේ, පත්වන අගවිනිසුරුවරයා, පොද්ගලිකව ජනාධිපතිවරයාටත්, ඔහුගේ විධායක බලයටත්, ඔහුගේ ආණ්ඩුවටත් පමණක් වගකියන, ඔවුන්ගේ අභිලාෂයන් අනුව කටයුතු කරන, එතිසාම අධිකරණය සිය ස්වාධීන භූමිකාවෙන් පිළිපන්නවන මිනිස් අයිතිවාසිකම් සම්බන්ධයෙන් කනගාටුදායක අනාගතයක් ඇතිවීමය.

(උපුටා ගැනීම රාවය පුවත්පතෙනි)

38 වන පිටෙන්

න් කථා කරන්න වෙනවා කියල කල්පනා කරල මෙහෙම කිව්වා.

මන් ළඟදී මහණ වුනේ. එතරම් දෙයක් මන් දන්නේ නෑ කියල ඇඟට නොදැනී කිව්වා. එතකොට උපතිස්ස කිව්වා සාදු, මගේ නම උපතිස්ස. ටිකක් හරි කිව්වත්, ගොඩක් කිව්වත් කමක් නෑ. ඒක විදි සියයකින්. නැත්නම් දහස් විදියකින් කල්පනා කරල තේරුම් ගන්න එක මගේ වැඩක් නේ කියල.

අස්සජි සාදු මුළු බුදු දහමම එකතු කරල මෙහෙම කිව්වා

යම් දෙයක් පහල වෙන්න හේතුව බුදුන් තේරුම් කරයි. ඒ අනුව ඒ දේ නිවී යාමද පැහැදිලි කරයි.

මුළු විශ්වය ගැනම ඉතාම මූලික නියමය මෙයින් පැහැදිලි කළා. ඒ තමා හේතු උත්පාදක නියමය. මැවුම්කරුවන් මෙන්ම ආත්මවාදයදු මේ නියමයෙන් සුන් වෙනවා. අස්සජි සාදු අසූ මහ ගෝලයන් අතරට අයත් වුණත් සදාතනික වන්නේ මේ පුංචි වචන කිහිපය නිසයි. එදා මෙදා සියළු දකින්නන්ට හෙගල්, මාක්ස්, නැත්නම් අල්තුසර්වත් මේ දේ මිට වඩා හොඳින් කියන්න බැරි වුණා. මාක්ස් මේ නියමය සමාජ විග්‍රහයට දමල මෙහෙම කිව්වා. ඩඩසමාජ රටාවන් පවතින්නේ ඊට හේතු වන නිෂ්පාදන සම්බන්ධතා උඩයි. නිෂ්පාදන සම්බන්ධතා වෙනස්වීමත් සමග සමාජ දේශපාලන රාමුව බිඳ වැටෙනවා.

පුදුමය මේ වචන ටිකෙන් සාමාන්‍ය තර්ක ඥානයෙන් එහාට ගමන් කරල, ලෝකය වටහා ගන්න උපතිස්සටත් ඊළඟට කෝලිතටත් හැකි වුණ එකයි. ඒ විතරක් නෙවෙයි මේ දෙන්න ඊට පස්සේ බුදුන්ගේ ගෝලයන් බවට පත් වුණා. ඒ තමන්ගේ නම් අම්මාවරුන්ගේ නම් අනුව මාරු කරල. රූපසාරි, හා මොග්ගලි යන අයගේ දරුවන් හැටියට කාන්තාවදිව නම් මාරු කරගත්තා. ඒක හරිම වැදගත්. මොකද? පැරණි මොහෙන්දජාරෝ සම්ප්‍රදාය කන්තාවාදියි. ආර්ය බමුණු සම්ප්‍රදාය ඊට හාත්පසින්ම වෙන්ස් වූ පිතෘමූලික සම්ප්‍රදායක්. ගැහැනියට ආගම ධර්මය තියා සංස්කෘත භාෂාව හදාරන්නවත් ඉඩක් තිබුනේ නෑ. මේ දෙන්නත් බුදුන් වගේම කාන්තාවාදී සම්ප්‍රදායයකට ඇතුල් වුණා. බුදුන් තම නම හැටියට ගත්තෙත් තමන් හදා ගත් පුංචි අම්මාගේ නම ගෝතමී ගෙන්.

ඇත්ත ඉතිහාසය මොන තරම් විශ්මය ජනකද?

BLOG කතන්දර

නාඩි වාක්‍යය අහපු හැටි

දැන් අවුරුදු කීපයකට කලින් මට පොඩි චාන්ස් එකක් ලැබුණා, නාඩි වාක්‍යම් කියන ශාස්තරය අහන්න යන්න. වැඩේ සෙට් වුනේ මෙහෙමයි.

මගේ වැඩ පොළේ ඔටියා චන්ද්‍රගුප්ත කියලා පොරක් ටිකක්. මිනිහට චන්ද්‍රගුප්ත කියලා මං ඒ නම දැම්මේ මිනිහා, ටිකක් නොමේ හොඳටම, ඔය ගුප්ත විද්‍යා වැඩවලට කැමති හින්දයි. කොටින් ම පස්සේ කාලෙක චන්ද්‍රගුප්ත කාරයා බලෙක් ගැනත් පිස්සු වැටිලා ඔටියා. බබා ගේ නම ගාගි ද කොහෙද?

මේ නාඩි වාක්‍යම් ශාස්තර කොච්චර ඇත්තද කියනව නම්, තමන්ගේ නම, අම්මා, තාත්තා ගේ නම පවා හරියට කියනවයි කියලයි කියන්නෙ. හැබැයි ඉතිං, ඔය කතාව චන්ද්‍රගුප්ත කියනවා අතලා මට නං ඔහුගේ, ඒ අපි හොඳටම දන්න නම්, ගම් වගේ දේවල් වෙන කොහෙකුහුගේ සල්ලිත් ගෙවලා අහගන්න ඕනැද කියලයි!

ඔහොම ටික දවසක් යන කොට අපේ වැඩපොළේ තවත් පොරකට ඔහුනා මේ කියන ශාස්තරකාරයා ගෙන් නාඩි වාක්‍යම් අහගන්න. පොර දවසක් මට කතා කළා කොළඹ යන ගමන් සෙට් වෙමු කියලා ඔය වැඩේට. උගේ කාර, උගේ ප්‍රයටාල් ඔන්දා මාත කැමති වුණා ඒ ගමනට.
ඔන්න මලිතු යි මායි එදා කොළඹ ගිහින්, කොළඹ අර ලොකු හන්දැයෙන් හැරිලා, කොහෙද මන්දා ජනාකීර්ණ පැත්තක අතුරු පාරක් දිගේ ගිහින් කෙලවරේ තිබුණු ලොකු බිල්ඩිමක් ලඟ නැවැත්තුවා.

මේක කාමර කුලියට හොටලයක්. නාඩි වාක්‍යම් කියන්න ආවිත ඉන්න ඉන්දියන් පොරවල් මේ හොටලේ ඉඳන් තමයි ඔපරේට් වෙන්නේ.

කාරෙක නවත්තලා අපි එතනට ගියා. හාග් ඕටි බාග දෙකකට දෙන්නගේ ඇඟිලි සලකුණු අරගෙන නම් දාපුක් ලියා ගත්තා. මං නං දුන්නෙ තාත්ත ගේ නමයි වැඩි පරිස්සමට. මලිත් ට ඇපොයින්ට්මන්ට් එක දුන්නා මාස දෙකකට විතර පස්සේ එන දවසක. ර ලඟට පෝලිමේ ඔටිය මට දුන්නෙ, මලිත් ගේ දවසට සති දෙකකට පස්සේ එන දවසක්.

ඔන්න නියමිත දවසේ මලිත් කාරයා ගිහින් ශාස්තරෙ අහගෙන ආවා. පොර සැටිස්සගිඩි නෑ. නම පවා වැරදියටයි කියලා තියෙන්නේ. එක ගින්දා පොර අනාගතේ මහාචාර්ය කෙනෙක් වෙනවාය කියලා වරෙ කියපු අතාවැකි කොහොම විශ්වාස කරන්නද, නේද?

සති දෙකකට පස්සේ ඔන්න මගේ ශාස්තර ඇපොයින්ට්මන්ට් එකේ දවස එනවා - හෙට.
මං ඒ වෙනකොටත් හොඳටම එක්සයිටඩ්!

මගේ කරුණෙද මන්දා, එදා හවස ලංකාවේ පොඩි ග්‍රහයෙක් මාරු වුණා. පොඩි යි කියලා කියන්නේ -පොඩි පරේ හොම්බයක් තමයි කොළඹ පිරිරැහේ. ඉතිං, පඳුවදාට තියම්තව තිබුණු මගේ කොළඹ ගමන යන්න මට කතන්දර හාමිනේගෙන් අවසර ලැබුනෙ නෑ.

නමුත් සති දෙක තුනකට පස්සේ කොළඹ ගිය දවසක මං අමාරුවෙන් හොයාගෙන ඔය කියපු තැනට ගියා. එදා මට ලැබුණු ඇපොයින්ට්මන්ට් එක තව මාස තුනකට පස්සේ එකක්.

එත් ඒ දවසේත් වැඩේ වැරදුණා. ඒ මට වැඩපොළේ නොවැලැක්විය හැකි වැඩක් ගැසුණු හින්දයි.

එහෙම වුනත්, මං නං නෙමේ නාඩි වාක්‍යම් බලන අදහස අතහැරියේ. ආයෙ ගිහින් ගත්තා ඇපොයින්ට්මන්ට් එකක්. එකත් හැබැයි තිබුනේ තවත් මාස දෙක තුනකින්. මං ඔතන්නේ එ තරමට ඉල්ලමක් තිබුණා ඒ දවස්වල මේ නාඩි වාක්‍යම් වැඩේට.

මගේ වෙලාව කියන්නේ, හරියටම ඒ තුන්වෙනි දවසට සතියකට කලින් වැඩපොළේ වැඩකට පිටරටකට ගිහින් එන්න සෙට්වුණා. නාඩි වාක්‍යම් බලනවා වරග්‍යැ රාජකාරිය. මං වැඩේ අල්ලා දාලා රට ගියා.

ආයෙත් ඒ ගැන හිතුවේ මේ කතන්දර බිලොග් එකට ඒ කතාව ලියන්න තමයි. ඒ වීදියට මේ නාඩි වාක්‍යම් ශාස්තරෙ අහන අදහස අතහැරල ගන්න මට තවත් හේතුවක් තිබුණා.
මං මධ්‍ය තුන්පාරක් ම ඇපොයින්ට්මන්ට් අරගෙනත් නාඩි වාක්‍යම් ශාස්තරෙ අහගන්න බැරිවුණු බව අපේ චන්ද්‍රගුප්ත ට කිව්වහම, මිනිහ මොකක්ද දන්නවද කිව්ව කතාව?

අපි එක එක්කෙනා ගැන ඒ නාඩි වාක්‍යම් ලියන කොටම, ලියලා තියෙනවාලු, ඒ ඒ පුද්ගලයා ශාස්තරෙ අහන්නෙ හරියටම කවදාද කියන එකත්.

ඊට කලින් කොච්චර සැරයක් හරි ඒ ශාස්තරෙ අහගන්න ගියාට වැඩේ කරගන්න බැරි වුණා කියලයි!
අන්න ඒ නිසයි, මං අඳුරුදු ගාණක් ම ගිහිනුත් තාම ඒ ගැන නැවත ඔහුවව් නැත්තෙ.

මගේ දවස තාම ඇවිල්ලා නෑ!

කතන්දරකාරයා

ප/ලෑ
වැඩේ කියන්නේ මගේ කේන්දරේ අපේ මාරයා ට කියලා බලා ගන්න ගිහිනුත් මට ඔය සිද්ධියම නේ වුනේ. තරගෙකින් දිනලත්, ඒ වැඩේ වැරදුණා දෙපාරක් ම.
මං ඔතන්නේ මං මාරයාගෙන් මගේ කේන්දරේ බලලාගන්න දවස මගේ කේන්දරේ ලියවිලා ඇති. සමහරවිට ඒ දවස ලියවිලා තියෙන්නේ මාරයා ගේ කේන්දරයේ වෙන්නත් පුළුවන්!

http://kathandara.blogspot.com/